# දෙවිනුවර ප්‍රාදේශීය සභාව.
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 26 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ කිහිපයක් තිස්සේ ඉදිරියට ගෙනවිත් තිබුණ රු.821,986 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය, සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් හා හඳුනාගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකතු කල අගය මත බදු වෙනුවෙන් සභාව විසින් රඳවා ගනු ලැබූ හිලව් කල හැකි බදු මුදල රු.78,362 ක් වුවත් ඒ සඳහා ගිණුම්වල ගැලපීම සිදුකර නොතිබුණ අතර එකතු කළ අගය මත බදු තැන්පත් ලෙස ආපසු ගෙවිය යුතු තැන්පත් යටතේ හඳුනාගැනීමකින් තොරව රු.752,711 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) වීථි පහන් නඩත්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.24,684 ක මුදල, ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඈ) දේපල ණය ලබාගෙන තිබූ සභාවේ නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට සභා අරමුදලින් වැයකර තිබූ රු.503,089 ක් වූ පොලිය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඉ) එකතුව රු.160,405 ක් වූ ගිණුම් ශේෂ 08 ක් හඳුනා ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.8,718,491 ක් වුවද ජර්නල් සටහන් අංක 47 අනුව රු. 6,899,274ක් ලෙසට ගිණුම් ගත කර තිබුණෙන් ආදායම රු.1,819,217 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,255,260 ක දායක මුදල් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් සහ ගොඩනැගිලි 06 ක් සඳහා වැයකල රු.2,083,458 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) රථවාහන නැවතුම්පල බදු අයකිරීමේ ගිවිසුම අනුව බදුකරු විසින් වාර්ෂිකව රු.45,000 ක් ගෙවීමට එකඟවී තිබුණද ආදායම් හා වියදම් උපලේඛණය අනුව ලැබී තිබූ ආදායම රු.15,000 ක් පමණි. ඒ අනුව හිඟ ආදායම වූ රු.30,000 ක් ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.8,031,009 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 6,663,387 ක් වූයෙන් වෙනස රු.1,367,622 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 08 කට අයත් රු.60,027,662 ක් වූ ශේෂයන් සඳහා අයිතිය සනාථ කෙරෙන ලියවිලි, පැවැත්ම හා සභාව වෙනුවෙන් පරිහරණය කරන බවට සහතික කරන ලියවිලි, උපලේඛණ, විධිමත්ව පවත්වා ගෙන යන ස්ථාවර වත්කම් ලේඛණ, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම්, බැංකුවෙන් ලබාගත් ශේෂ තහවුරු සහතික ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 17 | ප්‍රා.ස.21 ආකෘතිය පරිදි උප පත්‍රිකා පිළිබඳව තොරතුරු ඇතුලත් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ii) රීති 101 | වැය කිරීමට බලය දුන් සභාවේ යෝජනා සම්මුතිය සඳහන් නොකරන ලද වවුචර් සඳහාද ගෙවීම් කර තිබුණි. |
| (iii) රීති 145 | එක් එක් තැන්පත් වර්ගය වෙනුවෙන් වූ මුදල් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් එක් එක් වර්ෂය අවසානයේ පිළියෙල කර නොතිබුණි. |
| (iv) රීති 153 | ප්‍රාදේශීය සභා ආකෘති පත්‍ර 7 ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව හිඟ ආදායම් වාර්තා පිළියෙල කර නොතිබුණි. |

(v) රීති 164 — සභාවේ ගිණුම් ලියවිල දෛනිකව ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි.

(vi) රීති 193 — අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය ශේෂය සමඟ සසඳා අතිරික්ත හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මු.රෙ. 237 — සමාලෝචිත වර්ෂයේ මිලදීගත් භාණ්ඩ තොග ලේඛණයට/ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කළ බවට වවුචරයේ සටහන් කර නොතිබුණි.

(ii) මු.රෙ. 395 — සේවක ණය සඳහා පවත්වාගෙන යනු ලබන අංක 7189778 දරන බැංකු ගිණුම හා අංක 1246 දරන බැංකු ගිණුම සඳහා සමාලෝචිත වර්ෂයට අදාල බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

(iii) මු.රෙ.396 (ඇ) — ජංගම ගිණුම් 02 ක් වෙනුවෙන් 2010 නොවැම්බර් මාසයේ සිට බැංකු සැසඳුම් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර පොදු ගිණුමේ රු.41,663 ක් වූ චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) මු.රෙ.507 — අතැති තොග වල අගය වාර්ෂිකව ගිණුම් වල ඇතුලත් කිරීම සඳහා වර්ෂය අවසන් දිනට භෞතිකව සත්‍යාපනය කර නොතිබූ අතර ස්ථාවර වත්කම් වල පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) මු.රෙ. 880 — ගබඩා භාරව සිටින නිලධාරීන් විසින් ඇප තැබීම් කර නොතිබුණි. නිලධාරීන් 07 දෙනෙකු විසින් වාරික වශයෙන් ගෙවා ඇති ඇප තැන්පත් රු.3,850 ක මුදල 2011 අගෝස්තු 12 විගණන පරීක්ෂණ දිනය වන විටත් ආයෝජනය කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,636,260 වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,869,122 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැවි විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව, 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| ආදායම් විෂයය | හිඟ ආදායම දෙසැම්බර් 31 දිනට | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | 2010 | 2009 | % |
| | රු. '000 | රු. '000 | |
| වරිපනම් | 1,572 | 1,293 | 21.57 |
| අක්කර බදු | 57 | 52 | 9.61 |
| බලපත්‍ර ගාස්තු | 103 | 102 | 0.98 |
| බදුකුලී | 3,283 | 2,312 | 41.99 |

### 2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු. 1,629,000 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත ඒවා ඇති රු.60,657 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.220,740 ක් භාණ්ඩාගාරයෙන්ද, රු.4,352,718 ක් පළාත් සභාවෙන්ද වශයෙන් එකතුව රු.4,573,458 ක් ලැබිය යුතුව තිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත රු. '000 | 2010 තථ්‍ය රු. '000 | 2010 විචලනය රු. '000 | 2009 අයවැයගත රු. '000 | 2009 තථ්‍ය රු. '000 | 2009 විචලනය රු. '000 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 20,200 | 16,953 | 3,247 | 16 ,171 | 15,965 | 206 |
| අනෙකුත් | 9,580 | 9,798 | (218) | 6,264, | 8,583 | (2,319) |
| උප එකතුව | 29,780 | 26,751 | 3,029 | 22,435 | 24,548 | (2,113) |
| ප්‍රාග්ධන වියදම | 42,270 | 37,863 | 4,407 | 10,450 | 16,768 | (6,318) |
| මුළු එකතුව | 72,050 | 64,614 | 7,436 | 32,885 | 41,316 | (8,431) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතියික | 18 | 19 |
| ප්‍රාථමික | 23 | 19 |
| වෙනත්/අනියම්/ තාවකාලික | - | 24 |

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම රු.16,952,540 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.10,836,000ක් පමණි. මේ අනුව රු.6,116,540 ක් වූ වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා අංක 14 හා අංක 28 දරන චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 24 ක් බඳවා ගෙන 2010 වර්ෂය වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.2,775,266 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එකී චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය.

2.5.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්

සභාව සතු රු.110,000 ක් වටිනා වත්කම් විෂයයන් 04 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව සභා භූමියේ පැවති බව නිරීක්ෂණය විය.

2.5.2 ලැබිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ, ලැබිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.79,451 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවා අයවීමට තිබූ හිඟහිටි සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,230,507 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

වීථි පහන් නඩත්තුව

සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය තුලින් ඒවා මිලදී ගැනීම සිදුකල යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක් භාවිතා කරමින් එක් එක් වීථි පහන් සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීමේදී ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව සඳහා රු.888,822 ක් වැයකර තිබුණද ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.53,252 ක් පමණක් වූ හෙයින් රු.835,570 ක වියදම සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය